බුදුසරණ
Buddhist Era 2547 Bak New Moon - Monday , April 19, 2004



## සිදුහත් කුමරු පා පහස ලද සුදෙවුන් රජ මාළිගයේ නටබුන්

### ⁂ ප්‍රඥාවෙන් අසමසම වූ බුදුරජාණන් වහන්සේ

– ගලගෙදර රතනවංස හිමි
බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය සහ බුදු සමය තුළ ප්‍රඥාවට හිමි වන ප්‍රමුඛතාව. ලෝකයෙහි යථා තත්ත්වය සහ ඊට දක්විය යුතු නිවැරැදි ප්‍රතිචාරය වටහා ගැනීම සඳහා ප්‍රඥාව වර්ධනය කිරීමේ අවශ්‍යතාව – බුදු දහම තුළ අවධාරණය කර ඇති අයුරු.

### ⁂ මූලික මිනිස් අයිතිවාසිකම් සුරකින පංච ශීල ප්‍රතිපදාව

– ඩබ්ලිව්. කේ. උපසේන
මිනිස් සමාජයේ පැවැත්මට අත්‍යවශ්‍ය ප්‍රාථමික ජීවන පිළිවෙතක් වශයෙන් සැලකෙන පංච ශීල ප්‍රතිපදාවේ වැදගත්කම – දහම තුළින් විමර්ශනයට ලක් කිරීමකි, මෙම ලිපිය. මිනිසාගේ අධ්‍යාත්මය හා ලෞකික පරිසරය සුරක්ෂිතතාවෙහි සහතිකයක් ලෙස – පංච ශීලයට ගිහි බෞද්ධ ප්‍රතිපදාව තුළ හිමි වන ප්‍රමුඛස්ථානය මෙම ලිපියෙන් පැහැදිලි කැරේ.

### ⁂ පරාභව සූත්‍රය පෙන්වා දෙන පිරිහීමේ දොරටු.

– ගම්පොළ ඤාණසීහ හිමි.
ගිහි බෞද්ධ සමාජයේ භෞතික හා ආධ්‍යාත්මිකදියුණුවට අකුල් හෙළන පරිහානිකර ජීවන පිළිවෙත් රැසක් පහදා දීම සඳහා ඉදිරිපත් කැරුණු සුප්‍රකට පරාභව සූත්‍රයට අර්ථ විග්‍රහයකි, මෙම ලිපිය.

### ⁂ සංවර්ධනය පිළිබඳ බෞද්ධ සංකල්පය

– ආචාර්ය ජී.ඩී. ප්‍රේමසිරි
සංවර්ධනය පිළිබඳ විවිධ අදහස් පළ වන යුගයක – බුදු දහම තුළ මිනිසාගේ සංවර්ධනය සඳහා පෙන්වා ඇති මඟ පෙන්වීම. ආර්ථික සංවර්ධනය පිළිබඳ සමාජයක් ගමන් කළ යුතු නිවැරැදි මඟ සහ සමාජයක පිරිපුන් සංවර්ධනයක් සඳහා ප්‍රමුඛතාව දිය යුතු වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ මෙම ලිපියෙන් සාකච්ඡා කැරේ.

### ⁂ ප්‍රශ්න විසැඳීමේ බෞද්ධ ප්‍රතිපදාව

– කිරම විමලජෝති හිමි
ජීවිතයේ යථා තත්ත්වය පැහැදිලි කැරෙන බුදු දහම තුළ – ජීවිතයේ අසතුටුදායක පක්ෂය පමණක් නොව එම අසතුටුදායක තත්ත්ව වලට මුහුණ දිය යුතු ආකාරය ද පැහැදිලි කර දී ඇති අයුරු. ජීවන ගැටලු හමුවේ පුද්ගල මනස සමබර ලෙස පවත්වාගත යුතු අයුරු ද, ගැටලු හටගැනීමේ හේතු – ඵල ධර්මතා පැහැදිලි කර ගැනීමෙන් ඒවා නිරවුල් කරගත යුතු අයුරු ද පහදා දීමට ලේඛකයා මෙමගින් උත්සාහ දරයි.

### ⁂ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි
බුදු දහම හා ඒ ආශ්‍රිත විවිධ කරුණු පිළිබඳ පාඨකයන් දැනුවත් කරන – කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම හදාරන සිසුන්ට – මෙම විශේෂාංගය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකි ය.

### ⁂ දුක් සසර දිගු වන හැටි

– දිවියාගහ යසස්සි නා හිමි
දහම නොදන්නා පුද්ගලයා – පාපයට හා අකුසලයට නැඹුරු වී සසර දිගු කර ගන්නා අයුරු. වෙන කවර දැනුමකින් වුව නොලැබෙන අධ්‍යාත්මික දියුණුවෙහි ස්ථිරභාවය – දහම් අවබෝධය තුළින් සහතික වන අයුරු.

### ⁂ නව අගමැති සිරි දළදා සමිඳු වැඳ පුදා ගනී.

අසේල කුරුළුවංශ සහ ප්‍රදීප් කුමාර ධර්මරත්න
ශ්‍රී ලංකාවේ නව අගමැතිවරයා වශයෙන් පත් වූ මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී දළදා මාළිගාවට සහ මහ නාහිමිවරුන් බැහැ දැකීමට ගොස් ත්‍රිවිධ රත්නයේ ආශීර්වාද ලබා ගත් අන්දම දැක්වෙන ප්‍රවෘත්ති සහ ඡායාරූප.

## ⁜ තලාතුඩුව විවේක සේනාසනය

– ජනක වෙත්තසිංහ

දකුණු පළාතේ ගාල්ල ප්‍රදේශයේ සිට ගාලු පාරේ පැමිණ හබරාදූව කොග්ගල ගුවන් හමුදා හන්දියෙන් වමට ඇතිපාරේ කිලෝ මීටර් එකක් පමණ යන විට හමු වන වසර එකසිය දෙකක් පමණ පැරැණි අතිශය සුන්දර පරිසරයක පිහිටි ආරණ්‍යයක් පිළිබඳ විස්තර – මෙවර 'සිත් සනසන සෙනසුනෙන්.'

## ⁜ පිරුවානා පොත් වහන්සේගේ අන්තර්ගතය පිළිබඳ විමසීමක

– එච්.ජී. පියසේන

'පිරුවානා පොත් වහන්සේ' නමින් සුප්‍රකට පිරිත් පොතෙහි ඇතු–ළත් පිරිත් සූත්‍ර දේශනා පිළිබඳ විමර්ශනයකි. ඒ ඒ පිරිත් සූත්‍ර දෙශනා කිරීමට පසුබිම් වූ හේතු සාධක, එම පිරිත් සූත්‍ර දේශනා කිරීමේ අරමුණු සහ එමගින් ලද හැකි අධ්‍යාත්මික සහ ලෞකික ඵල ප්‍රයෝජන හෙළිදරව් කිරීම, ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ.

## ⁜ බුදු සසුනේ දියුණුවට හොඳ කලක් ලබන ලකුණක්

–මහාචාර්ය රීස් ඩේවිස්

## ⁜ බන්ධ පබ්බ ආයතන පබ්බ භාවනා.

– උතුරාවල ධම්මරතන හිමි

'සතර සතිපට්ඨාන භාවනා විධි' විශේෂාංගය යටතේ මෙවර පළ වන්නේ විමුක්ති ලාභය සඳහා සසර පැවැත්ම සිදු වන නිසාම ධර්–මතා අවබෝධ කරගැනීම සඳහා සිදු කළ යුතු විදර්ශනා භාවනාව මගින් 'ස්කන්ධ' හා 'ආයතන' පිළිබඳ නිවැරැදි වැටහීමක් ඇති කර ගන්නා අන්දමය.

## ⁜ වාරණ රජමහා විහාරය

– චම්පිකා රාජපක්ෂ

පෙර රජ දරුවන්ගෙන් පවා බුහුමන් ලද ඓතිහාසික – දර්ශනීය – සුප්‍රකට බොදු පුදබිමක් පිළිබඳ තොරතුරු – මෙම ලිපියෙන් ඉදිරි–පත් කැරේ. කොළඹ –නුවර ප්‍රධාන මාර්ගයේ තිහාරිය මංසන්ධි–යෙන් දකුණට හැරී සැතැපුම් දෙකක් පමණ ගිය විට දකුණු පසින් දිස්වන විහාරස්ථානයකි.

## ⁜ Kanha Jatakaya

-by Dr. S. G. Samarasinghe Of Samskrti Research e-mai.sqsa@sltnet.lk